# කෘෂිකර්ම සංගණනය 2002 පිළිබඳ කමිටු සාකච්ඡාව

**දිනය** - 2001-04-04 වන දින පස්වරු 2.00 ට ප්‍රධාන කාර්යාලයේදී

**සහභාගිත්වය**

1. ඒ ජී ඩබ්ලිව් නානායක්කාර මහතා සංගණන අධිකාරි සහ ජන සං අ. ජනරාල්
2. බී ඩී පී එස් විද්‍යාරත්න මහත්මිය අධ්‍යක්ෂ
3. ආචාර්ය ගාමිණි ද සිල්වා මහතා අධ්‍යක්ෂ
4. ඒ එම් යූ දිසානායක මහතා නියෝජ්‍ය අධ්‍යක්ෂ
5. ඒ ජේ සනරසිංහ මහතා සංඛ්‍යාලේඛනඥ
6. ඩී ඩී එම් වී පෙරේරා මහත්මිය සංඛ්‍යාලේඛනඥ

සංගණන අධිකාරි හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡාව ආරම්භ විය.

02. 2001-03-12 දින පැවැති රැස්වීමේදී කෘ.සං.1 හා කෘ.සං.2 උපලේඛනයෙහි තොරතුරු රැස් කළ යුතු ගොවි කාරකයන් තෝරා ගැනීමේ ගැටළු සහගත තත්ත්වය පිළිබඳව සාකච්ඡා කළ අතර, ගොවි කාණ්ඩයේ බිම් ප්‍රමාණය සඳහා අවම සීමාවක් තිබිය යුතු බවටද අදහස් ඉදිරිපත් විය. ඒ අනුව කෘ.සං.1 උපලේඛනය තුන් ආකාරයකින් පිළියෙල කොට මේදින සාකච්ඡාව සඳහා ඉදිරිපත් කරන ලදී.

**එනම්:-**

(1) 8 වන තීරුවෙන් ගොවි කාණ්ඩයේ බිම් ප්‍රමාණය පර්චස් 40 ට අඩුද, 9 වන තීරුවෙන් නිෂ්පාදනය ගෙදර පරිභෝජනය සඳහා යොදා ගන්නේද යනුවෙන් විමසීම.

(2) ඉහත කරුණු දෙකම එක් උපතීරුවකින් ලබා ගැනීම.

(3) බිම් ප්‍රමාණයකින් තොරව නිෂ්පාදනය ගෙදර පරිභෝජනය සඳහා යොදා ගන්නේද යන්න විමසීම.

ඉහත අංක.1 අනුව උපතීරු දෙකකින් යුත් උපලේඛනය මගින් තොරතුරු සියල්ල ලබා ගැනීම සඳහා පූර්ව පරීක්ෂණයක් කර, වඩාත්ම සුදුසු පරිදි කෘ.සං.1 උපලේඛනය සකස් කර ගැනීමටද කමිටු සාමාජිකයෝ එකඟත්වයට පත්වූහ.

03. තීරු අංක 11 සිට 36 දක්වා තීරු පිළිබඳවද ගැටලුවක් ඇති නොවූ අතර, කෘ.සං.2 උපලේඛනය සමගම පූර්ව පරීක්ෂණය කළ යුතු බවට තීරණය කළහ.

**කෘ.සං.2 උපලේඛනය**

04. ගොවි කාණ්ඩයේ නිෂ්පාදනයෙන් වැඩි ප්‍රමාණයක් අලෙවි කරනු ලබන ගොවි කාණ්ඩයන්ට අදාල විස්තර කෘ.සං.2 උපලේඛනයෙන් සම්පූර්ණ කරනු ඇත.

05. පවුල් කාණ්ඩයේ සියළුම සාමාජිකයන් අවශ්‍ය නොවන බවත්, වයස ස්ත්‍රී පුරුෂ භාවය හා අධ්‍යාපන සුදුසුකම් ආදිය පිළිබඳ විස්තර ගොවි කාරකයාගෙන් පමණක් ලබා ගැනීම ප්‍රමාණවත් බවට තීරණය විය.

06. 2 වන හා 3 වන කොටස් පිළිබඳ කමිටුව එකඟත්වයට පත්වූහ.

07. 4 වන කොටසෙහි සඳහන් පරිදි ගොවි කාණ්ඩයෙහි වැඩි බිම් ප්‍රමාණයක් එම ප්‍රා.ලේ.කොට්ඨාශයට පිටස්තරව පිහිටා ඇත්නම්, අදාල ප්‍රා.ලේ.කොට්ඨාශයේ නම සඳහන් කරනවාද,එසේ නොමැති නම් ප්‍රා.ලේ.කොට්ඨාශය අනුව ගොවි කාණ්ඩ වෙන් කර ගන්නවාද යන්න පිළිබඳව සාකච්ඡා කරනු ලැබීය. මේ සම්බන්ධයෙන් අවසාන තීරණයක් ගැනීම සඳහා මීලඟ කමිටු රැස්වීමේදී තවදුරටත් සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වෙමින් මෙම සාකච්ඡා වාරය පස්වරු 4.30 ට පමණ නිම කරන ලදී.

ඩී.ඩී.එම්.වී. පෙරේරා
සංඛ්‍යාලේඛනඥ